JSS 2024 2(2): 91- 103

Journal of Social Sciences (JSS)
Volume 02 – Issue 02

# THE CONTEMPORARY SOCIAL SITUATION REVEALED THROUGH THE INFORMATION PRESENTED ABOUT THE REIGNS OF THE KALINGA DYNASTY DURING THE POLONNARU KINGDOM PERIOD

**Wijerathna S.W.S.G.**
Department of History, Faculty of Arts, University of Peradeniya, Sri Lanka

## ABSTRACT

*When examining the political history of Sri Lanka, the genealogical factor comes to the fore in the power struggle that occurs with statehood and the growth of the state. It can be clearly identified that the genealogical factor was not the only factor in obtaining state power, but it was one of the most important factors. Since there has been a tradition of hereditary succession of the state since early times, dynasties such as Maurya, Lambakarna, and Manavamma have competed for the state inheritance during the Anuradhapura Kingdom Period. During the Polonnaru Kingdom Period, this struggle between the Pandya and Kalinga dynasties emerged, and it can be recognized that the various activities of both parties affected the shaping of the country's history in various ways. As the problem of this research, what the contemporary society was like, as revealed by the information revealed about the times of the Kalinga dynasty rulers during the Polonnaruwa period? The non-field method was used this research and according to the qualitative research method, the library research method was used to collect data by using primary and secondary sources, analyze the data and draw conclusions. As a result of the marriage relationships of King 1 Vijayabahu, the Kalinga dynasty, which was a foreign dynasty, is associated with the statehood of Sri Lanka, and later on, it is seen that it acquires state power. When examining the information revealed through literary and archaeological sources related to the reigns of the rulers of Kalinga dynasty, many facts about various aspects of contemporary society are revealed, and it seems that a lot of information about the social situation is also revealed. It is clear that aspects such as social stratification, various castes, and craft grades, as well as the interrelationship between castes, are revealed.*

**KEY WORDS**: Archaeological Sources, Kalinga Dynasty, Kingship, Literary Sources, Polonnaru Kingdom Period, Social Status

**හැඳින්වීම**

අතීත මානවයා විසින් සිදු කරන ලද දේශපාලන , ආර්ථික, සමාජයීය හා සංස්කෘතික ක්‍රියාවලීන් පිළිබඳ අධ්‍ය යනය කිරීමක් ඉතිහාසය විෂය තුළදී සිදු වේ. ඒ අනුව ශ්‍රී ලාංකේය මානව ඉතිහාසය පිළිබඳ විමසීමේදී දේශපාලනික ඉතිහාසයට මූලික ස්ථානයක් හිමිවේ. ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසය තුළ රාජවංශ අතර ඇතිවන දේශපාලන බල අරගලයන් මෙරට දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක සාධකයක් වූ බව පෙනීයයි. මේ ආකාරයට අනුරාධපුර රාජධානි සමයේ අවසාන භාගයේ සිට ශ්‍රී ලාංකේය රාජ්‍යනත්වය සමඟ සබඳතා පවත්වන කාලිංග වංශිකයන් වඩාත් ප්‍රයගතිගාමී ආකාරයෙන් ඉදිරියට පැමිණෙන්නේ පොළොන්නරු සමයේදී බව පැහැදිලිය. විශේෂයෙන්ම 1 වන විජයබාහු රජුගේ විදේශ සබඳතාවල ප්‍රතිඵල ලෙස කාලිංග පෙළපත මෙරට රාජ්‍යයත්වය හා සම්බන්ධ වන අතර මෙරට දේශපාලන ක්ෂේත්‍රවයේ ප්‍රබල රැගුම්කරුවෙකු බවට පත් වී රාජ්‍යයත්වය සඳහා පාණ්ඩ්‍යර වංශය සමඟ ප්‍ර බල ලෙස ගැටුම් ඇතිකර ගන්නා ආකාරය දක්නට ලැබේ. මූලාශ්‍රපයගත තොරතුරු විමසීමේදී කාලිංග වංශික පාලකයන් ලෙසට සළකනු ලබන්නේ 1 වන වික්‍රමබාහු වන ගජබාහු, 6 වන මිහිඳු, නිශ්ශංකමල්ල, 1 වන වීරබාහු, 2 වන වික්‍රමබාහු චෝඩගංග, සාහස්සමල්ල, කල්‍යාණවතී ධර්මාශෝක, ලෝකේශ්වර, මාඝ යන පාලකයන්ය (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 5 8, 30 ගාථාව - පරි 87, පූජාවලිය, 1951 : 782 -784 පි.). මෙයින් නිශ්ශංකමල්ල රජු මෙරට ඉතිහාසයේ වෙනත් කිසිදු පාලකයෙකු සිදු නොකළ අන්දමින් තම වංශය වෙනුවෙන් කැපකිරීම් සිදු කර තිබෙන බව දක්නට ලැබේ. ඔහු මෙරට ජනතාවගේ මනසට කාලිංග යන නාමය තදින් කාවැද්දීමට ප්‍ර යත්නයන් රාශියක් ගෙන ඇති අතර මෙරට ඉතිහාසයේ වැඩිම සෙල්ලිපි ප්‍රමාණයක් පිහිට වූ පාලකයා ලෙස ද හඳුනාගත හැකිය. මෙම ශිලා ලේඛන වෙතින් විශේෂයෙන්ම කාලිංග වංශය පිළිබඳ බොහෝ තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් වේ. පොළොන්නරු රාජධානි සමයේ ආරම්භයේ සිට අවසානය දක්වාම මෙම කාලිංග වංශය පිළිබඳ තොරතුරු සාහිත්‍යමය හා පුරාවිද්‍යා ත්මක මූලාශ්‍රද ඇසුරින් හඳුනාගත හැකි අතර විදේශීය වංශයක් ලෙස කාලිංග වංශය මෙරට රාජ්‍ය ත්වය කෙරෙහි සුවිශේෂී බලපෑමක් සිදු කිරීමට සමත් වූ බව ගම්‍යවමාන වේ.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යටයන ක්‍රවමවේදය භාවිතා කරන ලදී. එහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රයමවේදයට අනුගතඹුස්තකාල පර්යේෂණ ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රඇ හා ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීමත් දත්ත විශ්ලේෂණය කිරීමත් අනතුරුව ක්‍ර මානුකූලව පෙළගැස්වීම සිදු කළ අතර පසුව නිගමනවලට එළඹීම සිදු කරන ලදී.

**සාකච්ඡාව**

පොළොන්නරුව පාලන මධ්‍යතස්ථානය කරගත් අවධියේ සමාජ තත්ත්වය පිළිබඳ විමසීමේදී කාලිංග වංශික පාලකයන්ගේ සමයන්ට අදාළව විවිධ මූලාශ්‍රධයන්ගෙන් ඉදිරිපත් වන තොරතුරු වැදගත් වන බව දක්නට ලැබේ. නිශ්ශංකමල්ල රජ සමයට පෙර අවධිය විමසන විට නිකවැරටිය අසල පිහිටි බුදුමුත්තෑවෙන් හමු වූ 2 වන ගජබාහු රජුගේ සමයට දින නියම කළ හැකි දෙමළ ශිලා ලිපිය කුල අනුව සමාජය ස්තරගත වීම පිළිබඳව තොරතුරු සපයන වැදගත් ලිපියකි. රදවුන් හා කම්මල්කරුවන් අතර වූ ආරවුලක් පිළිබඳව ශ්‍රීත වීරබාහු දේවාර් හෙවත් 2 වන ගජබාහු රජුගේ නිලධාරීන් 5 ක් විසින් පූර්ව චාරිත්‍රහ පිළිබඳව කරුණු සොයා බලා ඒ අනුව රදවුන්ගෙන් කුල සේවා ලබා ගැනීමට කම්මල්කරුවන්ට අයිතියක් තිබුණු බවට ස්වකීය තීරණය දක්වන ලද බව මෙම ශිලා ලිපියේ සඳහන් වේ ( **Epigraphia Zeylanica Vol. III**, 1933 : p. 302-312.). එහි දැක්වෙන ආකාරයට රදවුන් සතු චාරිත්‍රa වූයේ දැරියක් වැඩිවිය පැමිණි විට කොටහට සැපයීම වැනි

චාරිත්‍ර ඉටු කිරීමඋත්සව අවස්ථාවන්හිදී පාවාඩ දැමීම වැනි චාරිත්‍රයන්ය. බුදුමුත්තැව ශිලා ලිපිය විවිධ කුලවල පිරිස් තවත් කුලවල අයට කිසිදු ප්‍රඋතික්ෂේප කිරීමකින් තොරව කුල සේවාවන් ඉටු කළ යුතු වූ බව ඉඟි කරයි. එම ශිලා ලිපියේ "පූර්ව චාරිත්‍රු පිළිබඳ කරුණු සොයා බලා..." වශයෙන් දැක්වෙන සඳහන අනුව කුල 2 ක ජනයා අතර වූ සබඳතාවය හුදෙක් සිරිත් විරිත් හා සමාජ භාවිතය මඟින් නියම වූ බව පෙන්නුම් කරයි (සිරිවීර, 2001 : 328-329 පි.).

නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපි අධ්‍යයනයේදී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ සමාජයේ විවිධ ස්තර නියෝජනය කරන බව හඳුනාගත හැකි වීමයි. මෙම ස්තර වනාහි පූජක පන්තියේ සිට රජු, රාජ සභාව, ගොවි, වෙළඳ, කම්කරු, සාමාන්‍යක ජනතාව ආදී ලෙසට සමාජය තුළ බෙදී ගිය රටාවක් පෙන්නුම් කරයි. නූතන සමාජය විමසන විටද ස්තරගත සමාජයක් දක්නට ලැබීම අනිවාර්ය සන්සිද්ධියකි. ඉහළ ස්තරයක් සමාජය තුළ නියෝජනය කරන විට පහළ ස්තරයක් නියෝජනය කිරීම නිතැතින්ම සිදු වේ (රණසිංහ, 2018 : 247 පි.). සමාජයේ ස්තරගත වීම පාලන සංවිධානයක් ඇති වීමේ එක් සාධකයක් ලෙස පුරාතන රාජ්‍ය යන් ගණනාවක් ඇසුරින් කරන ලද පර්යේෂණවලින් ලත් දත්ත අනුසාරයෙන් ක්ලැසන් හා ස්කාල්නික් විසින් පෙන්වා තිබේ. එසේම ෆ්ලීඩ් විසින් ද රාජ්‍ය යක් ඇති වීමේ එක් හේතුවක් ලෙසින් සමාජයේ ස්තරගත වීම හඳුන්වාදී තිබේ. සමාජය තුළ ස්තරගත වීමක් ඇති වීම කෙරෙහි ආර්ථික හා සාමාජීය කරුණු රැසක් බලපාන ලද බව ඔවුන් සිය පර්යේෂණ තුළින් හඳුනාගෙන තිබේ (ධීරානන්ද හිමි, 2004 : 194-244 පි.).

නිශ්ශංකමල්ල රජු විසින් ක්ෂත්‍රියයන් රාජ්‍ය ත්වයට තෝරාගත යුතු බවත් ගොවි කුලයෙහි ඇත්තන් රාජ ලීලාවට නොපැතුව යුතු බව **ගල්පොත ලිපිය** වැනි ලිපි කීපයකම දක්වා තිබේ (**Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 109.). යම් යම් අයට දෙන ලද දීමනාවන් අයත් කරගතහොත් හෝ විනාශ කළහොත් ඔවුන් කුලෙන් හීනයන්ට ද කවුඩු, බලුන් ආදීන්ට ද සමාන වන බව සාහස්සමල්ල රජුගේ පුවරු ලිපියේ දක්වා තිබේ ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 224.). කල්‍යාකණවතී රජින සමයේදී ආයස්මන්ත විසින් මිශ්‍රා වීමෙන් අපිරිසිදු වී තිබුණු සතර කුලයන් වෙන්කොට පවිත්‍රව කිරීම සිදුකළ බ**මහාවංසයේ** සඳහන් වේ (ඌනපූරණසහිතො මහාවංසො, 2012, පරි 80, 41 ගාථාව.). කෙසේ නමුත් එකී කුල 4 මෙහි නම් වශයෙන් දක්වා නොතිබීම මහත් පාඩුවක් බව **ඇම්. බී. ආරියපාල (**2014 : 277 පි.) පවසයි.

කාලිංග වංශිකයන්ගේ පාලන සමය තුළදී විශේෂයෙන්ම නිශ්ශංකමල්ල රජුගේ පාලන සමය තුළදී සමාජයේ ස්තරගත වීම පිළිබඳ විමසන විට ආගමික නායකයා ලෙස පිළිගත් භික්ෂුවට සමාජයේ මෙන්ම රාජ්‍යපයේ ද ප්‍රමුඛත්වය ලැබී ඇති බව දැකිය හැකිය. උන්වහන්සේලා අර්ථයෙන්, ධර්මයෙන් රජුට අනුශාසනා පවත්වමින් සමාජයේ ඉහළ ස්තර නියෝජනය කර ඇත. රජු සමීපයෙහි සිටිමින් පාලන යාන්ත්‍රණය හෙබවීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් භික්ෂූන් වහන්සේලා විසින් සිදුකර ඇති බව පැහැදිලිව පෙනේ (රණසිංහ, 2018 : 248 පි.). මෙම ස්තරයේ ප්‍රභූත්වය දරන රජු වනාහි ඉහළම ස්තරය නියෝජනය කරයි. භික්ෂූන් හා සම ස්ථානයක් නොගත්ත ද සමාජය තුළ සෙසු පිරිස් නියෝජනය කරන ස්තරයන්ට වඩා ඉහළම ස්තරයේ රජු වැජඹෙන බව පැහැදිලිය.

මෙකල දේශපාලන සහ පරිපාලන යාන්ත්‍රනණය මෙහෙය වූ ප්‍රඉධානතම නියමුවා පාලකයා වුවද ඔහුට උදව් උපකාර කිරීම සඳහා යම්කිසි උපදේශක මණ්ඩලයක් සිටි බව දක්නට ලැබේ. විජයබාහු රජුගේ **පනාකඩුව තඹ සන්නසෙහි** ‘‘රජගණ’’ ලෙස සඳහන් වන ආකාරය හඳුනාගත හැකිය. මෙහිදී ‘‘රජගණ’’ යනුවෙන් අදහස් කර තිබෙනුයේ ‘‘රාජ සභාව’’ බව පෙනේ (**Epigraphia Zeylanica Vol. IV**, 1966 : p. 20.). 2 වන ගජබාහු රජුගේ **කපුරුවැඩු වැව**

**ලිපියෙහි** ද ''ඇමති ගණා'' යනුවෙන් සඳහනක් දක්නට ලැබේ. නිශ්ශංකමල්ල රජු ''ඇමති ගණා'' පිරිවරා සිටි බව **දොරටියාව සන්නසේ** සඳහන් වන බව පෙනේ. මෙහි ''ඇමති ගණා '' යන කාණ්ඩයට අයත් වූ පිරිස නම් අග බිසව, යුවරජු, සෙනවිරත්, අධිකාරිවරුන් තිදෙනා හා සභාපතිනා යන අය බව පෙනේ. ලීලාවතී රැජිනගේ **අනුරාධපුර පුවරු ලිපියෙහි** ද ''මඩුල්ල'' යන්න දැක්වේ. එයින් අර්ථවත් වන්නට ඇත්තේ අමාත්‍යඅ මණ්ඩලය බව පෙනේ ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 180.).

මෙකල ස්තරගත සමාජ තත්ත්වය පිළිබඳව අධ්‍යෙයනයේදී නිශ්ශංකමල්ල රජුගේ අමාත්‍යප මණ්ඩලයේ ස්තරගත වීම පිළිබඳ විමසා බැලීම වැදගත්ය. විශේෂයෙන්ම නිලතල අනුව අසුන් පැනවීමත් ඒ අනුව රාජ සභාව නියෝජනය කිරීමත් මෙහිදී සුවිශේෂී වේ. රාජ සභාවේ අසුන් ගැනීමට යෝග්‍යන සුදුසුකම් ඇති නිලධාරීන් පිළිබඳව තොරතුරු නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාව රැස් වූ මණ්ඩපයේ ගල් ටැම්වල ලියවා ඇති ලිපි ඇසුරින් හඳුනාගත හැකිය. ඒ අනුව ''මාපා'' තනතුරු දැරුවන් සිහසුනට දකුණු දෙසින් පිහිටි ගල් අසුනක අසුන්ගෙන තිබෙන අතර ''ඇපා'' වරුන් හෙවත් රාජ කුමාරවරුන්, ''සෙනෙවිවරුන්'' , ''ප්‍ර ධානයන්''හා ''පොත්වරුන්'' ඇතුළු කායස්ථයන් සඳහා වෙන්කොට තැබූ ආසන සිංහාසනයට දකුණු දෙසින් තවත් ඈතින් පිහිටා ඇති බව පෙනේ. ''සෙනෙවිරදුන් සඳහා ආසන වෙන්කර තිබූ ස්ථානයට විරුද්ධ දිශාවේ ටැඹේ සිට වම් පැත්තේ අසුන් ගත්තේ අගම්පඩින් භාරව සිටි ''මාණ්ඩලිකයන්'' බව පැහැදිලිය. ''වෛරාසීවරුන්'' සහ ''කඩගෝෂ්ඨියේ ඇත්තවුන්'' සඳහා වෙන්කර තිබුණේ සිහසුනට තවත් ඈතින් එම පැත්තෙන්ම පිහිටි අසුන් බව පෙනේ. එසේම ඇතැම් විශේෂ අවස්ථාවන්වලදී හිඳ ගැනීම සඳහා බිසෝවරුන් දෙදෙනාට වෙන්කර තිබුණේ යැයි සැළකිය හැකි අසුන් ද වේ (රණසිංහ, 2018 : 249 පි.).

රාජමන්ත්‍ර)ණ සභා ගොඩනැඟිල්ලේ නිශ්ශංකමල්ල රජු උතුරට මුහුණලා අසුන්ගත් විට දැක්වෙන පිළිවෙළ අනුව කිසියම් ස්තරගත රටාවක් දැක්වෙන බව පැහැදිලිය. ස්තරගත වීමක් රාජ සභාව තුළ එකල නියෝජනය නොවූයේ නම් මේ ආකාරයට ගල් කුලුනුවල සඳහන් කොට තැබීමක් අවශ්‍යක නොවන බව පැහැදිලිය. නමුත් නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාවේ වූ නිලධරයන්ගේ නිලයන්හි නිශ්චිතභාවයත් ඔවුන්ගේ නිලයන්හි උසස් පහත්භාවයත් මෙලෙස දක්වා තිබීමෙන් එකී නිලයන්හි ස්වභාවය ඉස්මතු කිරීමක් අපේක්ෂා කර ඇතැයි සිතිය හැකිය (රණසිංහ, 2018 : 250 පි.).

තත්ත්වයෙන් උසස් යැයි සම්මත නිලයන් දැරුවන් අතරින් මාපා, ඇපා, සෙනවිරදුන් රාජ සභාවේ නිලයන් දැරූ බව පෙනේ. නිශ්ශංකමල්ලගේ මන්ත්‍රිණ සභාව පාලන යාන්ත්‍ර,ණයේ සෑම අංශයක්ම පාහේ නියෝජනය කළ නිලධාරීන්ගෙන් සමන්විතව තිබූ බව ඔවුන්ගේ නම් සහ තනතුරු අනුව පෙනේ. නිශ්ශංකමල්ල රජුට දකුණු පසින් මුල්ම අසුන හිමිව තිබුණේ යුවරජ තනතුරට පත් මාපාණන්ට බව පෙනේ. ඔහු නිශ්ශංකමල්ල රජුගේ පුත් වීරබාහු විය හැකිය. ඇපාවරුන් ඊට පසු පසින් සිටි අතර එම ස්ථානය ගෙන සිටින්නට ඇත්තේ නිශ්ශංකමල්ලගේ සහෝදර වික්‍ර මබාහුය. ඇපාවරුන් යන්න බහු අර්ථයෙන් යොදා තිබුණ ද නිශ්ශංකමල්ලට සිටින්නට ඇත්තේ එක් ඇපා කෙනෙකු පමණක් බව ඔහුගේ සෙල්ලිපි අධ්‍යෙයනය කිරීමේදී තහවුරු වේ. ඇපාවරුන් අසුන්ගෙන සිටි අසුනට පිටුපසින් අසුන් ඇත්තේ සෙනෙවිරදුන්ය. සෙනෙවිරදුන් යන්න බහු වචන පදයක් වන අතර පරණවිතාන මහතා දක්වනුයේ සෙනවිරදුන් කිහිපදෙනෙකු සිටින්නට ඇති බවයි (පරණවිතාන, 1972 : 539 පි.).


නිශ්ශංකමල්ල රජුගේ දොරටියාව සන්නස් ප්‍රරදානෝත්සවයේදී රජු,බිසව සහ මාපාට අනතුරුව සිටි උසස්ම නිලධරයා ලෙස ලක් විජය සිඟු සෙනෙවි තාවුරුනා බව සඳහන් කරයි. **පූජාවලියට**

අනුව ලක් විජය සිඟු සෙනෙවි තාවුරුනා නිශ්ශංකමල්ලගේ සෙනවිරදුන් යැයි අනුමාන කළ හැකිය (පූජාවලිය, 1951 : 784 පි.) . එසේම "ලක්විජය සිඟු" යන්න ද නිශ්ශංකමල්ල විසින් සෙනවිරද්කම හා අගමැතිකම සඳහා දෙන ලද නිල නාමයක් බව සැළකේ. නිශ්ශංකමල්ල රජුගේ සෙනෙවිරදුන් කවරෙක්ද යන්න පිළිබඳව පැහැදිලිව සඳහන් නොවේ. නමුත් රජු දඹදිව සටනට නික්මුණ කල්හි සටන සාර්ථකව මෙහෙයවූ ලක්විජය සිඟු තාවුරුනා නැමැත්තෙකු පිළිබඳ නිතර සඳහන් කරයි. නිශ්ශංකමල්ල රජුගේ මරණයෙන් පසු රජ වූ ඔහුගේ පුත් වීරබාහු විසින් තාවුරු සෙනෙවිරද් නැමැත්තෙක් රාත්රි්යේදී ඝාතනය කළ බව **පූජාවලියේ** (1951 : 784 පි.) සඳහන් වේ. මෙසේ ඝාතනයට ලක් වූ තාවුරු සෙනෙවිරද් නිශ්ශංකමල්ලගේ සෙනෙවිරදුන් වූ ලක්විජය සිඟු තාවුරුනා බවද සිතිය හැකිය (රණසිංහ, 2018 : 251-252 පි.).

සෙනෙවිරද්වරුන්ට පසුපසින් වූ අසුන හිමි වූයේ ප්රලධානයන්ටය. නිශ්ශංකමල්ලගේ මන්ත්ර ණ සභාවේ සිටි මෙම ප්රුධානයන් වනාහි මූලිකයන්, නායකයන්, වැදගතුන් ලෙස අර්ථ ගැන්වේ . දොරටියාව සන්නසෙහි සඳහන් පරිදි ප්රනධානයන් වනාහි රාජ සභාවට අයත් වූ අධිකාරීවරු යැයි අනුමාන කළහැකි බව **මැන්දිස් රෝහණදීර** පවසයි (රෝහණදීර, 1998 : 109 පි.). 2 වන ගජබාහු රජුගේ **බුදුමුත්තෑව ලිපියෙහි** සඳහන් වන ආකාරයට කම්මල්කරුවන් හා රෙදි සෝදන්නන් අතර වූ මතභේදයක් නිරාකරණය කිරීම සඳහා මානාභරණ පංච ප්රනධානයන් යැවූ බව සඳහන් වේ (Paranavitana, 1933 : p. 302-312). මෙම පංච ප්ර්ධානයන් ශිල්පී කුල පහක නායකයන් ක් බව පිළිගෙන තිබේ. පරාක්ර2මබාහු කුමරු රජරට චර පුරුෂ සේවයේ යෙදී සිට නැවත මායා රටට පැමිණීමේදී ඔහු කැඳවාගෙන ඒමට පංචපේසිය වග්ග නායක සම්මත ජනයා යැවූ බව **මහාවංසයේ** සඳහන් වේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 65, 58 ගාථාව.). "පංචපේසිය" යනු වඩුවන්, පෙහෙකරුවන්, රෙදි සෝදන්නන් ආදී ශිල්ප ශ්රේපණි බව **විල්හෙල්ම් ගයිගර්** මහතාගේ අදහස වේ (ගයිගර්, 1969 : 45-47 පි.). මෙම ප්ර ධානයන් යන්න බහු වචනාර්ථයක් ලබාදෙන බව පෙනේ. ප්රගධානයන් යන්න වැදගතුන් ලෙසට අර්ථ නිරූපණය කළද ඔවුන් කවර තරාතිරමක පුද්ගලයන්ද යන්න අපැහැදිලිය (රණසිංහ, 2018 : 253 පි.).

නමුත් නිශ්ශංකමල්ල රජුගේ සෙනෙවිරදුන්ගෙන් අනතුරුව සිටි ප්ර2ධානයන් මෙබඳු ශිල්පි ශ්රේ්ණි නායකයන් විය හැකිද යන්න සාහස්සමල්ලට මෙරටට පැමිණෙන ලෙසට පත් යවා ඇත්තේ මල්ලිකාර්ජුන නම් ප්ර්ධානී කෙනෙකු අතෙහි බව සඳහන් වීමෙන් ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 223.) ගැටලුවක් පැන නගී. මෙම ප්රhධානීන් ඉහතින් සඳහන් කරන ලද ශිල්පී කුල නායකයන් විය හැකි ද යන පැනය මතුවන බව **මැන්දිස් රෝහණදීර** විමසා සිටී. පළමුවන පරාක්රයමබාහු රජු තමාගේ රාජ්යන පවත්වාගෙන යාමේදී පිහිට වූ තනතුරු සියල්ල "ප්ර ධාන වෘත්තීන්" වශයෙන් **නිකාය සංග්රවහයෙහි දළදා පූජාවලියෙහි** හඳුන්වනු ලබන ආකාරය අනුව මෙහි උසස් තනතුරු යන අරුතක් ගැබ්ව ඇති බව **මැන්දිස් රෝහණදීර** තවදුරටත් පෙන්වා දෙයි (රෝහණදීර, 1998 : 110 පි.) . එකී තොරතුරුවලින් පැහැදිලි වනනේ නිශ්ශංකමල්ල රජුගේ මන්ත්රහණ සභාවේ සිටි ප්රබධානීන් පංචවග්ගික ශිල්පී නායකයන්ට වඩා උසස් වැදගත් නිලධරයන් සමූහයක් විය හැකි බවයි. නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාවේ සිටි නිලධාරීන් සහ **නිකාය සංග්රකහ, දළදා පූජාවලිය** ආදියේ සඳහන් වන පරාක්රාමබාහු රජුගේ නිලධරයන් සමඟ කොඩ්රිංටන් සන්සන්දනය කර තිබෙන බව පෙනේ (කොඩ්රිංටන්, 1961 : 67-69 පි . මෙලෙස කොඩ්රිංටන් සසඳා ඇත්තේ "අධිකාර" යන්නයි. සභාපතිනා ඇතුළු ඉහත සඳහන් කළ නිලධරයන් ද නිශ්ශංකමල්ලගේ ප්රනධානයන් අතර සැළකිය යුතුය යන්න කොඩ්රිංටන් පවසයි. එවිට නිශ්ශංකමල්ල රජුගේ ප්රධධානයන් යන්නට සභාපතිනා හිරිත් ලේනා, දූලේනා, මහ වෙදනා, මහ නැකතිනා, දහම්පස යන නිලධරයන්ද ඇතුළත් වූ බව අනුමාන කළ යුතුය (රෝහණදීර, 1998 :

110 පි.). සභාපතිනා යන්න දොරටියාව සන්නසෙහි සඳහන් වන සභාපති නායකයාම විය හැකිය. එනම් ප්‍ර ධාන විනිශ්චයකාරයා හෙවත් අග්‍රය විනිශ්චයකරුය. මොහු වනාහි පොළොන්නරු යුගයේ ඉතා වැදගත් තැනක් ගෙන සිටි නිලධාරියෙකි. නිශ්ශංකමල්ල රජුගේ අවධියේ රචිත යැයි සැළකෙන **සාධුචරිතෝදය** ''ගජභුජ'' නම් සභාධිපතියෙකු විසින් ආරාධිතව සිදු කරන ලද්දක් බව ග්‍රන්ථ අවසානයේ දැක්වේ(**සාධුචරිතෝදය,** 1961) මෙම ගජභුජ සභාධිපති දොරටියාව ලිපියේ සඳහන් ගජබාහු සභාපතිනාවන් යැයි හඳුනාගැනීමට බාධාවක් නොමැති බව පැහැදිලිය (රෝහණධීර, 1998 : 111 පි.).



නිශ්ශංකමල්ල රජුගේ රාජ සභා මණ්ඩපය

මේ ආකාරයට ස්තරගත රාජ සභා ක්‍රමය තුළ සිටින රාජ්‍යී තාන්ත්‍රිකයන් හට තනතුරු පිරිනමා ඇත්තේ ද රජු කෙරෙහි පවතින්නා වූ සමීපභාවය අනුවය. සභාපතිනා වනාහි පොළොන්නරු රාජධානි සමයේ සිටි ඉතා වැදගත් තත්ත්වයක් ඉසිලූ නිලධාරියෙකි. පරාක්‍රමබාහු ආදිපාද රජරට සිට නැවත මායා රටට පැමිණීමේදී ඔහු කැඳවාගෙන ඒමට යැවූ උසස් නිලධාරීන් අතර සභාපතිනා ද සිට ඇත (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 65, 64-65 ගාථා.) . **මහාවංසයේ** සඳහන් තොරතුරු අනුව සභාපතිනා ප්‍රාටදේශීය භටහමුදා විසින් බැහැ දැකිය යුතු උසස්ම නිලධාරියෙකු පමණක් නොව අපරාධ විනිශ්චය කොට දඬුවම් පැමිණවීම කෙරෙහි කිසියම් බලයක් ඇති උසස් නිලධාරියෙකු බවට ඉඟියක් ලැබේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 65, 64-65 ගාථා.) **සෙනරත් පරණවිතාන** සභාපතිනා යනු විනිශ්චය සභාවේ ප්‍රධානියා හෙවත් අග්‍රය විනිශ්චයකරු වැනි තනතුරක් දරන්නෙක් බව විශ්වාස කරන්නේ මේ කරුණ පදනම් කොටගෙන බව රෝහණධීර පවසයි (රෝහණධීර, 1998 : 113 පි.). එහෙයින් සභාපතිනා රටේ නීතිය සම්බන්ධව සිටි ප්‍ර ධානියා නිසා සෙනෙවිරත් ළඟට සිටිය හැකි ඉතා උසස් නිලධාරියෙකු බව පිළිගත හැකිය.

නිශ්ශංකමල්ල රජුගේ මන්ත්‍ර ණ සභාවේ සිටි නිලයන් අතුරින් ඒ ඒ අයට පැවති සත්‍යන බලය අනුව බලන විට අධිකාරීවරුන් පිළිබඳව තොරතුරු ලැබේ. ඔවුහු ''අධිකෘත'' යන සංස්කෘත වචනයෙන් හැඟවෙන අරුතට සමාන බව පෙනේ. ඉන් අදහස් කර ඇත්තේ රාජ්‍යඅයේ කිසියම්

දෙපාර්තමේන්තුවක වැඩ කටයුතු පිළිබඳ සම්පූර්ණ පාලන බලතල ඇති උසස්ම නිලධාරියෙකු බව විය හැකිය (පරණවිතාන, 1972 : 512 පි.). ගයිගර් විසින් අධිකාරීන් වනාහි හමුදාපතිවරුන් බව දක්වයි (ගයිගර්, 1969 : 150 පි.) එහෙත් එය නිශ්ශංකමල්ල රජුගේ සමය සමඟ සැසඳීමේදී නිවැරදි නොවේ. නිශ්ශංකමල්ල රජු තම රුවන්වැලි සෑ පූජෝත්සවයෙන් පසු එහි සිටි ලෝකේඅරක්මේනාවන් අධිකාරි බවට පත්කොට මිරිසවැටිය ආදී වූ විහාර කරවනු සඳහා ඔහුට ධනය දුන් බව **රුවන්වැලි සෑ පුවරු ලිපියෙහි** සඳහන් වන බව පෙනේ (**Epigraphia Zeylanica Vol. II**, 1928 : p.109.). නිලයේ ස්වරූපය අනුව මහනුවර යුගයේ "අධිකාරම" යන්නට අනුරූප බව පිළිගත හැකිය (රෝහණදීර, 1998 : 114 පි.). නිශ්ශංකමල්ල රජුගේ කාලයේදී ද මෙබඳු අධිකාරවරුන් 5 ක් පිළිබඳව ඔහුගේ සෙල්ලිපිවලින් තොරතුරු හමුවේ. දොරටියාව සන්නසේදී අධිකාර ලෝලූපැලැකුලූ කිතල්නාවන්, අධිකාර කොටදනවු සාතානාවන්, අධිකාර කොටදනවූ සුවනාවන් යන තිදෙනා ද **ගල්පොත ලිපියෙහි** දී ලිපිය ලිවීම සඳහා සැගිරියෙන් ශිලා ඛණ්ඩය ගෙන්වූ අධිකාර කොටදනවු මන්දනාවන් ද (**Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 109.) රුවන්වැලි සෑ පූජෝත්සවය අවසානයේ මිරිසවැටිය ආදී ස්ථාන පවරමින් අධිකාර තනතුර දෙනු ලැබූ ලෝකේ අරක්මේනාවන් ද ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 78.) යන අයවලුන් මෙබඳු අධිකාරවරුන් වේ. මෙම නිලයන් සඳහා ලැබිය යුතු ගරුත්වය ද රාජ සභාවේදී සේම ජන සමාජයෙන්ද එක සේ නොඅඩුව ලැබී ඇතැයි නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපි අධ්‍යයනයේදී පැහැදිලි වේ. එහෙත් අධිකාරි යන්න කෙබඳු නිලයක් දැයි අපැහැදිලිය (රණසිංහ, 2018 : 256 පි.).

නිශ්ශංකමල්ල රජුගේ දොරටියාව සන්නසෙහි සඳහන්වන ලංකාධිකාර ලෝලූපැලැකුලූ ලෝකේනාවන් ද එකල රාජ සභාවේ සිටි පුද්ගල තනතුරක් බව පෙනේ. ලෝලූපැලැකුලූ ලෝකේනාවන් නැමැත්තෙකු විසින් දොරටියාව සන්නස ප්‍රලදානය කළ බව සඳහන්ය. මෙහිදී "ලංකාධිකාර" සහ "අධිකාර" යන්නෙහි අදහස පැහැදිලි නොවූනද "අධිකාර " යන්න ඇමති පදවිය වැනි නිලයන් සඳහා යෙදුණක් වූ අතර "ලංකාධිකාර" යන්න නිලනාමයකට වඩා ගරු නාමයක් ලෙස ව්‍යයවහර වන්නට ඇතැයි ඉතිහාසඥයින්ගේ පිළිගැනීම වේ. නිශ්ශංකමල්ලගේ රජුගේ ලිපි අතරින් දොරටියාව සන්නසෙහි පමණක් යෙදී ඇති මෙම "ලංකාධිකාර" යන නාමය ගරු නාමයක් වශයෙන් ද ව්‍යයවහර වී ඇති බව පෙනේ. "අධිකාර" යන්න ඇමති තනතුරක් වැනි නිලයක් සඳහා යෙදුනේ නම් ලංකාධිකාර යන්න කුමක් සඳහා යෙදුනේ ද ? යන ගැටලූව ඉස්මතු වේ (රණසිංහ, 2018 : 257 පි.).

නිශ්ශංකමල්ල රජුගේ සංස්කෘතික හෝ කලා කටයුතු භාරව සිටි නිලධාරියෙකු ලෙස අනුමාන කළ හැකි "කලානාවන්" වනාහි දොරටියාව සන්නස් ප්‍රකදානයේදී රාජ සභාවේ සිටියේ යැයි සැළකිය හැකි තවත් නිලධාරියෙකි. මොහු "කිළිගු මහ කිළිංගේවරු කලානාවන් " ය. මොහු සන්නස් ලිවීම ආදී කාර්යයන්හි පාරම්පරිකව යෙදී සිටි පවුලක අයෙකු බව ඉතිහාසඥයන්ගේ පිළිගැනීමයි. රජු ලෝකේනාවන්ට පමුණුව දෙන ලෙස අණ කරනු ලබන්නේ මෙම කලානාවන්ටය. එහෙත් මෙම කලානාවන් යන්න යම් ආකාරයකට සංඥා නාමයක් ලෙස ද සැළකිය හැකිය (රෝහණදීර, 1998 : 114-115 පි.). මොහු කාලිංග වංශයේ සන්නස් ලිවීමේ කාර්යයේ නිරතව සිටි එක් පරම්පරාවක් ලෙස සිතිය හැකිය.

නිශ්ශංකමල්ල රජුගේ රාජ්‍යප කාලයේදී සමාජයේ ස්තරගත වීම විශේෂයෙන්ම ඉහළ ස්තරයේ සිට පහළ ස්තරය දක්වා සකස් වී තිබූ බව පෙනේ. නිශ්ශංකමල්ල රජුගේ ඉහතින් දැක්වූ නිලධාරීන් සියල්ලම එනම් සෙනවිරදුන්, ප්‍රදධානයන්, සභාපතිනා, අධිකාර, ලංකාධිකාර, කලානාවන් ආදීන් කිසියම් උසස් පවුල් කීපයකට අයත් බව සැළකිය හැකි අතර මොවුන්ගෙන් එක් පවුලක් නම්

“ලෝලූපැලැකුලු” පවුලයි. මෙම පක්ෂය කාලිංග පක්ෂයට බෙහෙවින් හිතවාදී බව පෙනේ. නිශ්ශංකමල්ල රජුගේ ප්‍රධාන අධිකාරවරුන්ගෙන් කීපදෙනෙකු තෝරාගත් අනික් පවුල නම් “කොටදනවු” පවුලයි. **ගල්පොත ලිපිය** අනුව ලිපිය ලියවීමට ශිලා ඛණ්ඩය ගෙනා මනාවන් ද කොටදනවු පවුලේ අයෙකු බව පෙනේ. ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 109.) නිශ්ශංකමල්ල රජුගේ අගබිසව වූ කල්‍යාණවතී බිසවට උපකාර කරමින් සිටි දෙවෙල්නාවන් ද කොටදනවු පවුලේ අයෙකු බව පෙනේ. නිශ්ශංකමල්ල මේ ආකාරයෙන් රජ තනතුරෙහි පටන් සිය වංශයට ගැළපෙන හිතවාදී උසස් පවුල්වල ඇත්තන් රාජ සභාවේ ඉහළ තනතුරුවල රඳවා ගනිමින් ඉහළ සමාජ තත්ත්වයක් ඇති කිරීමට උත්සාහ කර තිබේ. විශේෂයෙන්ම කාලිංග වංශය අමතක නොකොට ඔවුන් උසස් යැයි සම්මතයෙන් ක්‍රියා කරන්නට ඇති බව ඉන් තහවුරු වේ (රෝහණධීර, 1998 : 115 පි.).

නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාවේ සිටි “පොත්වරුන්” හා “කායස්ථවරුන්” යන තනතුරු දැරූ නිලධාරීන් රජුගේ දකුණු පස අසුන්ගෙන සිටි නිලධාරීන් වේ. එසේම ඔවුන් කිසියම් ධූරාවලියකට අනුව සමාජගත වී ඇති අතර රජුගේ රාජ සභාවේ වම්පස සිටි පිරිස් ද මේ ආකාරයටම සමාන ස්තරයන් නියෝජනය කළවුන් වේ. රජුගේ වම් පස මුල් ආසන දෙකේ සිටින නිලධාරීන් පිළිබඳව තොරතුරු සඳහන් නොවේ. දකුණු පස අසුනේ දෙවන පෙළේ සිටි ඇපාවරුන්ට කෙළින්ම වම්පස අසුනේ අගම්පඩි භාර මාණ්ඩලිකවරුන් සිටි බව රාජසභාව රැස් වූ ගල් ටැම්වල දැක්වේ. ක්‍රි.ව. 10 සියවස්වල මණ්ඩලයක් භාරව සිටි නිලධාරීන් “මාණ්ඩලිකයන්” ලෙස සළකා ඇති බව හඳුනාගත හැකිය. නමුත් 12 වන සියවස වන විට මෙකී මණ්ඩල “රුහුණු රජය ”, “පිහිටි රජය” යනුවෙන් හැඳින්වූ අතර ඒ රාජ්‍යවල ද උප කොටස් “මණ්ඩල” නමින් හඳුන්වන ලද බව රෝහණධීර මහතා සඳහන් කරයි (රෝහණධීර, 1998 : 117 පි.). **මහාවංසයේ** පරාක්‍රමබාහු රජුගේ රුහුණ ආක්‍රමණය කිරීමේ විස්තරයේදී මණ්ඩල කිහිපයක නම් දක්වා තිබේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 73, 1-159 ගාථා.) . යුද කටයුතු සංවිධානය කිරීම මාණ්ඩලිකයන්ට පැවරුණ කාර්යභාරය වූ බව හඳුනාගත හැකිය. සෙනෙවිරදුන්ට කෙළින් දකුණු පසින් මොවුන්ට ආසන වෙන්කොට තැබීමෙන් ඒ බව සනාථ වේ. අගම්පඩි යනු හමුදාව යන අර්ථය ලබා දෙන්නකි. කෙසේ වෙතත් මාණ්ඩලිකයන් යුද කාර්යයේ යෙදෙමින් රාජ සභාවේ ද යම්කිසි ස්තරයක් නියෝජනය කළ පිරිස් ලෙස හඳුනාගත හැකි බව පෙනේ (රණසිංහ, 2018 : 260 පි.).

කඩගෝෂ්ඨියෙහි ඇත්තවුන් යන්නෙහි “කඩ” යන්න දෙමළ වචනයකි. එය “වෙළෙඳපොළ” යන අර්ථය බව පෙනේ. “ගොෂ්ඨ” යන්න සංස්කෘත වචනයක් සේ ගැනේ. සමාජය, සමිතිය, ශ්‍රේණිය යන්න එහි වචනාර්ථය වන බව පෙනේ (පරණවිතාන , 1972 : 514 පි.) . මේ අනුව බලන විට නිශ්ශංකමල්ලගේ මන්ත්‍රණ සභාවේ රාජ්‍යයේ විවිධ කාර්යාංශයන් නියෝජනය කළ නිලධාරීන් සිටි බව පෙනේ.

රාජ සභාවේදී නිලධාරීන්ගේ නියෝජනයන් දක්වෙන අංශ 2 ක් පිළිවෙළින් සමාජය තුළ හඳුනාගත හැකිය. එනම් වංශ හා සමාජ නායකත්වය සහ වෘත්තීමය හා බුද්ධිමය කාර්යය වශයෙනි. තම වංශය තුළ මෙන්ම සමාජයේ පොදු අවශ්‍යතතා හා ඔවුන්ගේ කාර්යයන් වඩා සරලව හා සාධාරණව ඉටුකර ගැනීම සඳහා නායකත්වය ලබාදුන් පිරිස් සමාජය සංවිධානය කිරීමේ කාර්යභාරයේදී ප්‍රමුඛත්වයක් දරා ඇත. මෙම තනතුරු පාරම්පරිකව ලැබී ඇති අතර එසේ නොලැබුණු අවස්ථාවන්ද මෙකල දැකිය හැකිය. කාලිංග වංශික උරුමය තහවුරු කරමින් විදෙස් කුමාරවරුන් හට තත්කාලීනව රජු විසින් හිමි කරදී තිබූ තත්ත්වය මෙයට කදිම උදාහරණයකි (රණසිංහ, 2018 : 261 පි.).


නිශ්ශංකමල්ල රජු දවස ඔහු විසින් පත් කරන ලද නිලධාරීන් සම්බන්ධව අවධානය යොමු කිරීමේදී පෙනීයන කරුණක් වන්නේ එම තනතුරු ගුරු කොට ගනිමින් තම අණසක පතුරුවා හැරීමටත් අනන්‍යතාව රැක ගැනීමටත් උත්සහ කර ඇති බවයි. සෙල්ලිපි පිහිටුවීමේදී විශේෂයෙන්ම නිශ්ශංකමල්ල රජුගේ රාජසභාවේ සිටියවුන් සම්බන්ධයෙන් තොරතුරු අන්තර්ගත කර තිබීම වැදගත්ය. බිසෝවරුන්ගේ පටන් වෛරාසිවරුන් දක්වා තනතුරු පිළිබඳව සඳහන් වීමෙන් මේ බව සනාථ වේ. මෙම තනතුරු ප්‍රෞසිද්ධ කිරීම ඔස්සේ සිදුකර ඇති අතර ඔවුහු තම කටයුතු ක්‍රමවත්ව කරගෙන යාම පිණිස රටෙහි ජන කණ්ඩායම් අතර සාමූහික බවක් සහ මිත්‍රයත්වයක් ගොඩනංවා ගනිමින් සමාජය මනාසේ සංවිධානය කරමින් ඉදිරියට ගෙනගොස් ඇත. මෙලෙසින් පොදු ජනයා තුළද යම්කිසි හික්මීමක් සහ සංයමයක් ඇති කරවීම පිණිස සමාජය ස්තරගත වීම අතිශය වැදගත්ය. සමාජය මෙසේ ස්තරගත වීම විශේෂයෙන්ම පාලන නායකත්වයක් බිහිවීම සඳහා අනුබලයක් වූ බවද කිව හැකිය (රණසිංහ, 2018 : 262 පි.).

කල්‍යාණවතී රැජිනගේ සමයේ සිදු කෙරුණු වැදගත් කාර්යයක් ලෙස **මහාවංසයේ** දැක්වෙන්නේ ආයස්මන්ත විසින් මිශ්‍රජ වී සංකීර්ණ වී තිබූ චතුර්වර්ණය අසංකීර්ණ කොට ධර්මාධිකරණ නම් නීති ශාස්ත්‍රයක් කරවීමයි (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 80, 41 ගාථාව.) . මෙසේ සංකීර්ණ වූ චතුර්වර්ණය අසංකීර්ණ කළ බව පැවසීමෙන් පෙනීයන්නේ ඒ වන විට පැවති දේශපාලන අස්ථාවරත්වය සමාජ සංස්ථාවල පැවැත්ම කෙරෙහි දැඩි අයහපත් බලපෑමක් ඇතිකර තිබෙන්නට ඇති බවයි. මෙම තත්ත්වය නිසා සාමාන්‍ය ජන සමාජය බරපතල කම්පනයකට ලක්ව සිටින්නට ඇත. එනිසා එම තත්ත්වය වෙනස් කොට ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට දරන ලද ප්‍රයත්නයක් ලෙස මෙය සැළකිය හැකිය (ඉලංගසිංහ, 2012 : 129-130 පි.).

මධ්‍යලකාලීන ලංකා සමාජයේ ජනතාවගේ ඇඳුම් පැළඳුම්,ආභරණ පැළඳීම විමසන විට ද සමාජ තත්ත්වය පිළිබඳ යම් තොරතුරු අනාවරණය කරගත හැකි වේ. ද්‍රවිඩ සොල්දාදුවන් කර්ණාභරණ පැළඳ සිටි බව **සද්ධර්මාලංකාරයෙහි** සඳහන් වන බැවින් කර්ණාභරණ ස්ත්‍රී -පුරුෂ දෙපාර්ශවයම භාවිතා කරන්නට ඇතැයි සිතිය හැකි වුවද සිංහල පුරුෂයින් එසේ කළ බවට නිශ්චය කිරීම උගහටය (ආරියපාල, 2014 : 321 පි.). යම්කිසි කර්මාන්ත කළ මෙහෙකරුවන්ට මැණික් අල්ලන ලද මුදු හා රන් රිදී ප්‍රදානය කරන ලද බව කල්‍යාණවතී රැජිනගේ සෙල්ලිපියේ සඳහන් වේ (**Epigraphia Zeylanica Vol. III**, 1933 : p. 256.). “මෙවුල්දම” නිරතුරුව අසන්නට ලැබෙන ආභරණයකි. අගමැති කෙනෙකුගේ මැණියන්ට සම්මාන වශයෙන් නම්බු නාමයක් ප්‍රදානය කොට මෙවුල්දමකින් සැරසූ බව් මෙවැනි දරුවන් ලද මවුන්ට වැඩි සත්කාර කළමනා වෙදැයි මොවුන් මැණියන්ට ලංකාතිලක මහදේවී යැයි නම් දී බඩ රන්පට බන්දවා... ” වශයෙන් දැක්වෙන සාහස්සමල්ල රජුගේ සෙල්ලිපි පාඨයෙන් පැහැදිලි වේ ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 223.).

තවද මෙකල සමාජ තත්ත්වය පිළිබඳ විමසන විට ප්‍රපවාහන මාධ්‍ය යන් පිළිබඳ විවිධ තොරතුරු හමුවේ. ප්‍රවහුන්ට විවිධ ප්‍රවාහන මාධ්‍යද පැවති බවක් දක්නට ලැබේ. විශේෂයෙන්ම සින්ඩ් සහ පර්සියානු දේශවලින් ගෙන්වන ලද අසුන් රජ පවුලේ සාමාජිකයන්, සේනාපති, අමාත්‍ය වැනි උසස් නිලතල දැරුවන් විසින් ප්‍රඅවාහනයේදී භාවිත කරන ලදී. අශ්වරථ රජ පවුල විසින් භාවිත කරන ලදී. ඇත්, අස්, රිය, පාබල යන චතුරංගනී සේනාවෙහි රථ පැවැතියේ ඉතා සුලූ වශයෙනි. යුද්ධ සම්බන්ධ ස්ථානයන්හි භූගෝලීය තත්ත්වයන් විසින් ඊට සීමාවන් පනවා තිබිණ. එහෙත් 1 වන පරාක්‍රමබාහු රජු හා 2 වන ගජබාහු අතර යුද්ධය වැනි යුද්ධවලදී අශ්වරථ භාවිත වූ බව වංසකතා සාහිත්‍යස සඳහන් කරයි (මහාවංසය, 2012 : පරි 70, 70 ගාථාව.) . මෙම යුද්ධයේදී පරාක්‍ර මබාහුගේ සේනාපතියකු වූ රක්ඛ වර්තමාන නාවුල-ඇලහැර මාර්ගයේ අලගමුව ලෙස

හඳුනාගත හැකි ආලිගාම නම් ස්ථානයේදී ගජබා රජුගේ පරාජිත හමුදාවට අයත් අශ්වරථ ඇතුලු යුද්ධ උපකරණ අල්ලා ගත් බව වංසකතාව දක්වයි (මහාවංසය, 2012 : පරි 70, 124 ගාථාව, සිරිවීර, 2001 : 170-171 පි.) . පොළොන්නරුවේ ගල්පොත ශිලා ලිපිය "වාහන නායක" නම් නිලයක් පිළිබඳ සඳහන් කරයි ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 108.). **සෙනරත් පරණවිතානට** අනුව මෙය වාහන සම්බන්ධ කටයුතු පාලනය කරන ලද රජයේ පරිපාලන අංශයක ප්‍රධානියකු හැඳින්වීමට යොදන ලදී. එසේ වුවද මෙම අංශයට අයත් රාජකාරී සහ වාහන නායක නිලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ යමක් පැවැසීමට මූලාශ්‍රගත සාධක ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන්ම දැව, ගල් පුවරු, යකඩ වැනි භාණ්ඩ ප්‍රවාහනයෙහිදී අලි ඇතුන් වැදගත් විය. පොළොන්නරුවේ **ගල්පොත ශිලා ලිපියේ** එම ලිපිය ලියවා ඇති විශාල ගල් පුවරුව නිශ්ශංකමල්ල රජුගේ යුද්ධ භටයින් විසින් සැගිරි ප්‍රදේශයෙන් ගෙන එන ලද බව ලිපියේ අවසානයේ සඳහන්ය ( **Epigraphia Zeylanica Vol. II**, 1928 : p. 108.). මෙහි සැගිරි යනුවෙන් හඳුන්වන්නේ මිහින්තලය ද නැතිනම් සීගිරිය ද යන්න පිළිබඳ එකඟතාවක් නොමැත. කෙසේ වෙතත් එය සීගිරිය වුවද , මිහින්තලේ වුවද විශාල ගල් පුවරුව දුරක සිට ගෙන එන ලද බව පැහැදිලිය. එබඳු විශාල ගල් පුවරු වැනි දේ ප්‍රවාහනයේදී දැව ලෑලි සම්බන්ධ කර, රෝද යොදා සකස් කර ගන්නා ලද වාහන ඇතුන් විසින් ඇදගෙන යන ලදැයි සිතීම සාධාරණ බව සිරිවීර ( 2001 : 167 පි.) පෙන්වා දෙයි. කාලිංග පෙළපත මෙරට රාජ්‍යොත්වය සමඟ පැවැත්වූ සබඳතාවල සමාජමය බලපෑම් පිළිබඳ සාකච්ඡා කරන විට කාලිංග මාඝගේ පාලන සමය පිළිබඳ අමතක කර සාකච්ඡා කළ නොහැකිය. මොහුගේ පාලන සමය තුළදී මෙරට සමාජය මහත් වූ ව්‍යසනයකට මුහුණදුන් බව පෙනේ. වංසකතා විසින් මාඝව හඳුන්වා ඇත්තේ මිථ්‍යාස දෘෂ්ටික, ආත්මාර්ථකාමී, නොඉවසිලිවන්ත, මුඪ, අධාර්මික, දුර්භීතිය ප්‍රිය කළුබුද්ධ ධර්මය විනාශ කළ තැනැත්තකු ලෙසය. ඔහුගේ අණ ක්‍රියාත්මක කළ සෙබළුන් ලක්වැසියා ක්‍රෑරර ලෙස පීඩාවට පත් කළ අයෙකු වශයෙනි. රටවැසියන්ගේ අත් පා ආදිය කපා ශාරීරික වධ වේදනා පමුණුවා ඔවුන් සතු වස්තුව පැහැර ගැනීම, ප්‍රතිමාසඬවෛත්‍යප හා විහාර විනාශ කිරීමඋපාසක උපාසිකාවන් හා මහා සංඝයා පෙළීම, පොත්පත් විනාශ කිරීම යනාදිය **මහාවංසයේ** සඳහන් වේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 78, 61-80 ගාථා, වික්‍රමසිංහ1972 : 496 පි.) . මාඝගේ සමාජමය හිංසනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන මහාවංසය දක්වන්නේ උසස් යැයි සම්මත කුලයන් නොසලකාහරින ලද බවයි (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 78, 62 ගාථාව.). **පූජාවලියට** අනුව කුල හීනයන් කුලීනයන් කර, කුලීනයන් කුල හීනයන් බවට පත්කර තිබේ (පූජාවලිය, 1951 : 785 පි.) . එමෙන්ම සතර කුලයන් මිශ්‍ර කිරීමටද ක්‍රියාකර තිබේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 78, 75 ගාථාව.). එමගින් එතෙක් පැවති සාම්ප්‍රදායික නිලබල ක්‍රමයඍමාජ රටාව බිඳ වැටීම සිදු වූ බව පෙනේ. මෙම තත්ත්වය නිසා සමාජයේ හා පරිපාලන තන්ත්‍රයේ උසස් තත්ත්වයක් හෙබවූ බොහෝ කුලීනයන් රජරට ප්‍රදේශ හැර දමා දිවයිනේ වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූ බව හඳුනාගත හැකිය.



**ගල්පොත සෙල්ලිපිය**

තවද වෙහෙර විහාර බිඳ දමමින් ද විහාර සන්තක දේපළ උදුරා ගනිමින් ද බෞද්ධ පොත්පත් රාශියක් විනාශ කරමින් ද ජනතාවට මිත්යාන දෘෂ්ටීන් කාවැද්දීමට ක්රිපයා කරමින් ද බුදු සසුණට කළ අතිමහත් ව්යාවසනය නිසා සමාජ ස්තරායනය තුළ ඉහළ තත්වයක වැජඹුනු බෞද්ධ භික්ෂූන් වහන්සේලා දන්ත ධාතුන් වහන්සේ ද රැගෙන විවිධ ප්රතදේශවලට පැනගිය බව පෙනේ (ඌනපූරණසහිතො මහාවංසො, 1959 : පරි 78, 63-67 ගාථා.). මෙකී තත්ත්වය තුළ සමාජයට සිදු වූ බලපෑම අතිමහත් බව පැහැදිලිය. මාඝ කාලිංග වංශයට ඥාතීත්වයක් ඇත්තෙකු වුවද ඔහුගේ මෙම ව්ය වසනකාරී කටයුතු නිසා සිදු වූ විනාශයෙහි වගකීම සියලූ කාලිංග වංශික රජුන් වෙත බැර කළ නොහැකිය. නමුත් කාලිංග පෙළපත මගින් සමාජයට සිදු වූ බලපෑම් පිළිබඳ විමසන විට ඔවුන්ගේ පාලන කටයුතුවල අවසාන කාලයෙහි මේ ආකාරයට මාඝ වෙතින් සිදු වූ අහිතකර බලපෑම් පිළිබඳ සඳහන් කිරීම ද කළ යුත්තකි.

මෙලෙස විමර්ශනය කරන විට සියවස් එකහමාරක පමණ කාලයක් මෙරට රාජ්ය ත්වය හා කාලිංග පෙළපත අතර පැවති සබඳතා පැවති අතර එකී කාලපරිච්ඡේදයට අදාළව සාහිත්ය මය හා පුරාවිද්යාංත්මක මූලාශ්රබ ආශ්රතයෙන් හෙළිවන තොරතුරු ඇසුරින් තත්කාලීන අවධියේ විවිධ අංශයන් පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය වන බවත් එහිදී සමාජමය තත්ත්වය පිළිබඳ අවබෝධ කරගැනීමට වැදගත් තොරතුරු ප්රවමාණයක් ඉදිරිපත් වන බවත් පැහැදිලි වේ. මෙකී මූලාශ්රර ඇසුරින් හෙළිවන තොරතුරු ආශ්රමයෙන් සමකාලීන අවධියේ සමාජයේ ස්තරගතවීම්, වෘත්තීන් මෙන්ම රාජ සභාවේ විවිධ නිලයන් ආදිය විමසන විට සමාජ ව්යුලහය හා සැකැස්ම පිළිබඳ මැනවින් හඳුනාගත හැකි වේ. තවද ඇතැම් පාලකයන්ගේ සමයන්ට අදාලව ඉදිරිපත් වන තොරතුරු ඇසුරින් සමාජයේ පැවති චාරිත්ර. වාරිත්, විවිධ ශිල්ප ශ්රේ◌ණි පිළිබඳව ද හඳුනාගත හැකිය.

**ආශ්රිරත ග්රජන්ථ නාමාවලිය**


ආරියපාල, ඇම්. බී. ( 1962). **මධ්යව කාලීන ලංකා සමාජය** . කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඉලංගසිංහ, මංගල. (2012). ''පොළොන්නරු රාජධානිය'', **ශ්රී ලංකේය ඉතිහාසය වෙළුම ii**සංස්. ඩබ්. එම්. කේ. විෙජ්තුංග. කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කිරිඇල්ලේ ඤාණවිමල හිමි , (සංස්.). (1951). **පූජාවලිය** . කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කොඩ්රිංටන්, එච්. ඩබ්. ( 1961). **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය** . පරි. කේ. එස්. සෙනෙවිරත්න. කොළඹ : රාජ්යම භාෂා දෙපාර්තමේන්තුවේ ප්ර කාශන අංශය.

ගයිගර්, විල්හෙල්ම්. (1969). **මධ්යරකාලීන ලංකා සංස්කෘතිය**පරි. ඇම්. බී. ආරියපාල, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත. (2004). **රාජත්වය රාජ්යනය සහ ආගම (ක්රිප. පූ. තෙවැනි සියවසේ සිට ක්රිර. ව. තෙවැනි සියවස දක්වා පුරාතන ශ්රීජ ලංකාවේ රාජත්වයේ හා රාජ්යියේ ආරම්භය වර්ධනය සහ ආගම අතර පැවැති සම්භන්ධතා පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්)** . වරකාපොල : ආරිය ප්රආකාශකයෝ.

පරණවිතාන, ඇස්. (1972). ''පොළොන්නරු යුගයේ සභ්යවත්වය දේශපාලනු ආර්ථික හා සමාජ තත්ව'', **ලංකා විශ්වවිද්යාතලීය ලංකා ඉතිහාසය i කාණ්ඩය, ii** භාගය . සංස්. හේමචන්ද්රෙ රාය. කැළණිය : විද්යාලංකාර විශ්වවිද්යාංලය.

පරණවිතාන, ඇස්. ( 1972). ''පොළොන්නරු යුගයේ සභ්යiත්වය (ඉතිරි කොටස) ආගම, සාහිත්යනය හා කලාව්', **ලංකා විශ්වවිද්යාගලීය ලංකා ඉතිහාසය i කාණ්ඩය, ii භාගය** . සංස්. හේමචන්ද්රා රාය. කැළණිය : විද්යායලංකාර විශ්වවිද්යාාලය.

බුද්ධදත්ත හිමි , ඒ. පී. (සංස්.). ( 1959). **ඌනපූරණසහිතො මහාවංසො** . කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රණසිංහ, ශ්යා මා කුමාරි. (2018). **නිශ්ශංකමල්ල රජුගේ දේශපාලන භූමිකාව** . කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණදීර, මැන්දිස්. (1998). **නිශ්ශංකමල්ල පොළොන්නරු යුගය.** මහරගම : තරංජී ප්රිවන්ටිස්.

වික්රීමසිංහසිරිමා. (1972). ''පළමුවැනි පරාක්රුමබාහු රජුගේ අන්තරාගාමිකයෝ පොළොන්නරු රාජධානිය බිඳ වැටීම '', **ලංකා විශ්වවිද්යා1ලීය ලංකා ඉතිහාසය i කාණ්ඩය, ii භාගය** . සංස්. හේමචන්ද්රබ රාය. කැළණිය : විද්යා ලංකාර විශ්වවිද්යාගලය.

**සාධුචරිතෝදය.** (1961). සංස්. බලපිටියේ උපරතන හිමි. කොළඹ : අනුල මුද්රිණාලය.

සිරිවීර, ඉන්ද්ර6කීර්ති.2001). **රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි** . කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

හික්කඩුවේ ශ්‍රීම සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමා (සංස්.). (2012). **මහාවංසය**. දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**Epigraphia Zeylanica Vol. I**. (1912). ed. D. M. de. Z. Wickremasinghe. London : Oxford University Press.

**Epigraphia Zeylanica Vol. II**. (1928). ed. D. M. de. Z. Wickremasinghe. London : Oxford University Press.

**Epigraphia Zeylanica Vol. III**. (1933). ed. D. M. de. Z. Wickremasinghe and H. W. Codrington. London : Oxford University Press.

**Epigraphia Zeylanica Vol. IV**. (1943). ed. S. Paranavitana, London : Oxford University Press.

**Epigraphia Zeylanica Vol. V**. (1966). ed. S. Paranavitana and C. E. Godakumbura. Ceylon : Archaelogical Department.